# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2037/18 - 2017 සැප්තැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2017.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78(xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මෙම නියමය මගින් (2017 පෙබරවාරි මස 08 වැනි දින අංක 2005/12 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර, එහි 21 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලබන, ශ්‍රී ලංකාවේ මොරටුව විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින්, 2006 නොවැම්බර් මස 03 වැනි දින අංක 1469/38 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දක්වෙන ''ඉංජිනේරු පීඨය'' යන අයිතමයට අනුරූපව II වන තීරයේ දක්වෙන සටහන් වෙනුවට පහත දක්වෙන කොටස ආදේශ කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

| ''*I වන තීරය* | | *II වන තීරය* |
|---|---|---|
| ඉංජිනේරු පීඨය | 1. | රසායන සහ සැකසුම් ඉංජිනේරු විද්‍යා අධ්‍යයන අංශය |
| | 2. | සිවිල් ඉංජිනේරු අධ්‍යයන අංශය |
| | 3. | පරිගණක විද්‍යා සහ ඉංජිනේරු විද්‍යා අධ්‍යයන අංශය |
| | 4. | විද්‍යුත් සහ විදුලි සංදේශ ඉංජිනේරු විද්‍යා අධ්‍යයන අංශය |
| | 5. | භූ සම්පත් ඉංජිනේරු විද්‍යා අධ්‍යයන අංශය |
| | 6. | ද්‍රව්‍ය විද්‍යා සහ ද්‍රව්‍ය ඉංජිනේරු විද්‍යා අධ්‍යයන අංශය |
| | 7. | ගණිත අධ්‍යයන අංශය |
| | 8. | යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යා අධ්‍යයන අංශය |
| | 9. | විදුලි ඉංජිනේරු විද්‍යා අධ්‍යයන අංශය |
| | 10. | පේෂකර්ම තාක්ෂණ අධ්‍යයන අංශය |
| | 11. | ප්‍රවාහන සහ සැපයුම් කළමනාකරණ අධ්‍යයන අංශය |
| | 12. | භාෂා අධ්‍යයන අංශය.'' |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍ය.

2017 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ දී ය.

10-101

1A - PG 3700 — 508 (2017/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*